රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය / எனது இல / My No: PS/GT/2020 (වෙළුම IV)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022.02.06

**<u>නවක නිලධාරීන්/අභ්‍යාසලාභීන් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ආයතනවලට ස්ථිරව අනුයුක්ත කිරීම</u>**

ඉහත වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් අතරින් ඒකාබද්ධ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන් ලෙස මෙතෙක් ස්ථිර පත්වීම් නොලද අභ්‍යාසලාභීන්ට පත්වීම් ලිපි නිකුත් කිරීම මේ වන විට අරඹා ඇත. ඒ අනුව අදාළ සේවා ස්ථානවලින් කරනු ලබන කැඳවීම් අනුව නව සේවා ස්ථානවල සේවයට වාර්තා කරන ලෙස මෙයින් දන්වනු ලැබේ. මෙහිදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ සමාංක හා 2022.01.03 දිනැති ලිපිය හා මගේ 2022.01.07 දිනැති ලිපි මගින් ආයතන ප්‍රධානීන් වෙත ලබා දී ඇත.

02. සේවා අවශ්‍යතාව මත සිදුකරනු ලබන සේවා ස්ථාන සංශෝධන හා ස්ථාන මාරු කිරීම් ද මීට සමගාමීව සිදු කරනු ලබන අතර ඒ අනුව නව සේවා ස්ථානවලට වාර්තා කිරීම හා පූර්ව සේවා ස්ථානවලින් නිදහස්ව නව සේවා ස්ථානවලට වාර්තා කිරීම කළ යුතුය.

03. පළාත් රාජ්‍ය සේවයට පත් කිරීමට නියමිත අභ්‍යාසලාභීන්ගේ අවසන් නාම ලේඛනය ද මීට සමගාමීව පළාත් සභාවලට යොමුකරනු ලැබේ.

04. පරිපාලනමය වශයෙන් මෙම පත්වීම් ක්‍රියාවලිය අවසන් කිරීමට ගතවන කාලයට අදාළව සේවා ස්ථානවලට වාර්තා කිරීම සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් දෙනු ලැබේ. එසේම පුහුණුව ලැබූ සුදුසුකම් සම්පූර්ණ කළ සියලු ම අභ්‍යාසලාභීන් විධිමත් ලෙස සංවර්ධන නිලධාරි සේවයට පත් කරනු ලැබේ.

05. එමෙන්ම සේවා ස්ථාන සංශෝධන/ස්ථානමාරු ක්‍රියාවලිය අවසන් කරන අවස්ථාව දක්වා ස්ථිර පත්වීම් ලද සේවා ස්ථානයට/ස්ථිර අනුයුක්ත කිරීම් ලිපි ලද සේවා ස්ථානයට හෝ අභ්‍යාසලාභි පදනමින් පුහුණුව ලැබූ සේවා ස්ථානයට හෝ අඛණ්ඩව සේවයට/පුහුණුවට යම් නිලධාරියෙකු/අභ්‍යාසලාභියෙකු වාර්තා නොකරයි නම් එම දින වැටුප් රහිත නිවාඩු දින ලෙස සලකා කටයුතු කරන බව ද දැනුම් දෙනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**Unemployment Graduates Placement Programme – 2020**

**The Schedule of Considering the appointments/Provincial attachment changes of Graduate trainees who were not still given appointments/Attachments to Permanent Places/Provincial Councils**

1. North Western Province → Kurunegala District
   Puttalam District

2. Uva Province → Badulla District
   Monaragala District

3. Western Province → Colombo District
   Kaluthara District
   Gampaha District

4. North Central Province → Anaradhapura District
   Polonnaruwa District

5. Eastern Province → Ampara District
   Trincomalee District
   Batticaloa District

6. Central Province → Kandy District
   Matale District
   Nuwaraeliya District

7. Southern Province → Matara District
   Galle District
   Hambanthota District

8. Sabaragamuwa Province → Rathnapura District
   Kegalle District

9. Northern Province → Mannar District
   Jaffna District
   Vavuniya District
   Mulaithivu District
   Kilinochchi District